සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි
**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

**දේශපාලන විද්‍යාව - I**
**Political Science - I**

23 S I

පැය දෙකයි
**Two hours**

විභාග අංකය : ....................................................................

*සැලකිය යුතුයි.*

- **මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සහ B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.**
- **එක් පිළිතුරකට ලකුණු දෙකක බැගින් මුළු ලකුණු 100කි.**

## A කොටස

- අංක 01 සිට 27 දක්වා වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතරින්, නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.

01. දේශපාලනය,
A - දේශපාලන පක්ෂ සහ දේශපාලනඥයන් ප්‍රධාන රැඟුම්කරුවන් වේ.
B - දේශපාලන දාර්ශනිකයන් සහ චින්තකයන්ගේ භූමිකාව වැදගත් වේ.
C - සම්පූර්ණයෙන් ම ප්‍රායෝගික ක්‍රියාවලියකි.
D - දේශපාලන බල අරගලය ජාතික වශයෙන් පමණක් නොවන අන්තර්ජාතික වශයෙන් ද ක්‍රියාත්මක වේ.
E - රාජ්‍ය බලය ඉක්මවා යන සමාජ ක්‍රියාවලියක් වේ.
(1) ABCD (2) ABCE (3) BCDE (4) ACDE (5) ABDE (......................)

02. දේශපාලන විද්‍යාව,
A - රාජ්‍ය, ආණ්ඩුව සහ මිනිසා අතර සම්බන්ධතාවය විද්‍යාත්මක සහ න්‍යායාත්මක හැදෑරීම.
B - මිනිසුන්ගේ දේශපාලන චර්යාව සහ දේශපාලන ක්‍රියාවන් අධ්‍යයනය කිරීම පිළිබඳ සැලකිලිමත් වේ.
C - ශුද්ධ විද්‍යාත්මක ක්‍රම මගින් පමණක් අධ්‍යයනය කළ හැකි විෂයයක් වීම.
D - දේශපාලන දාර්ශනිකයන්ගේ සහ දේශපාලන චිනකයින්ගෙන් අදහස් මඟින් පදනම සැපයීම.
E - කාලීන විකාශය සමඟ විෂය පථය පුළුල් වී ඇත.
(1) ABCD (2) ABCE (3) BCDE (4) ACDE (5) ABDE (......................)

03. රාජ්‍ය පිළිබඳ සමාජවාදී න්‍යායට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.
A - පූර්ව කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍ය නොතිබිණි.
B - රාජ්‍ය සදහටම පවතී.
C - එය පන්ති පීඩක උපකරණයකි.
D - පන්ති ප්‍රතිවිරෝධතා තිබෙන තාක් රාජ්‍ය පවතී.
E - කොමියුනිස්ට් සමාජය තුළ රාජ්‍ය වියැළී ගත්තේ ය.
(1) ABCD (2) BCDE (3) ACDE (4) ABDE (5) ABCE (......................)

04. ආණ්ඩුව,

A - ස්වාධිපත්‍ය බලය ක්‍රියාත්මක කරන සමස්ත සංවිධාන රටාවම වේ.

B - ලෝකයේ රාජ්‍යවල ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම විවිධ ආකෘතිවලින් සමන්විත වේ.

C - එක් අයෙකුගෙන්, කිහිප දෙනෙකුගෙන් හෝ බොහෝ දෙනෙකුගෙන් සමන්විත විය හැකිය.

D - ස්වාධිපති බලයේ එකම උරුමකරුවා වේ.

E - අස්ථිර ආයතනයකි.

(1) ABCD (2) ABCE (3) BCDE (4) ACDE (5) ABDE (......................)

05. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක මූලිකාංග දක්වෙන ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

A - නීතියේ ආධිපත්‍ය

B - ව්‍යවස්ථානුකූලවාදය

C - නිදහස් හා සාධාරණ මැතිවරණ

D - ඒක පක්ෂ ක්‍රමය

E - නිදහස් ජනමාධ්‍ය

(1) ABCD (2) BCDE (3) CDEA (4) DEAB (5) EABC (......................)

06. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීමෙහි ප්‍රතිඵලයක් වන්නේ,

A - ලෝකය පිළිබඳව ඇති මූලික සංකල්ප පිළිබඳව අවබෝධය ලැබීම.

B - යහපත් සමාජ ජීවියෙක් ගොඩනැගීම.

C - ලෝක දේශපාලනය පිළිබඳ හොඳ අවබෝධයක් ලැබීම.

D - ආණ්ඩු පෙරළීමට කුමන්ත්‍රණය කිරීම තුළ යහපත් සමාජයක් ගොඩනැගීම.

E - දේශපාලන පරිණතභාවයෙන් හෙබි පුද්ගලයකු බවට පත්වීම.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

07. විද්‍යාත්මක ප්‍රවේශය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A - නිවැරදි හා නිශ්චිත තොරතුරු මත පදනම් වීම.

B - අතිශෝක්ති යොදා ගනිමින් වර්ණනා යොදා ගනියි.

C - අනුභවික සහ වාස්තවික දත්ත මත පදනම්ව විශ්ලේෂණය කරයි.

D - එහි මූලධර්මය නම් වටිනාකම් විනිශ්චයන්ගෙන් නිදහස් ඥානය යන්නයි.

E - පුද්ගල දේශපාලන චර්යා අධ්‍යයනයට විද්‍යාත්මක ප්‍රස්තුත යොදාගනු ලබයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

08. ස්ත්‍රීවාදය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A - මෙහි මුඛ්‍ය අදහස වන්නේ ලිංගිකත්වය පුමිතිරිකරණය කොට තිබේය යන්නයි.

B - විවිධ ගුරුකුල ඔස්සේ ස්ත්‍රීවාදය ගොඩ නැගී ඇත.

C - ස්ත්‍රී ආධිපත්‍යයට පුරුෂයින් යටත් කළ යුතු බව ඔවුන්ගේ අදහසයි.

D - රාජ්‍ය පුරුෂ මූලික මෙවලමක් බව ඔවුන් පිළිගනියි.

E - ස්ත්‍රී විමුක්තිය සඳහා රාජ්‍ය මැදිහත් විය යුතු බව ලිබරල් ස්ත්‍රීවාදීහු ප්‍රකාශ කරති.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

09. යටත් විජිත රාජ්‍ය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A - යුරෝපීය නොවන රාජ්‍යයන් තුළ වර්ධනය විය.

B - 1815 දී ශ්‍රී ලංකාව මුළුමනින් ම යටත් විජිතයක් බවට පත් විය.

C - මිලිටරි නිලධාරිවාදී රාජ්‍ය වශයෙන් ගොඩනැඟුණි.

D - නීතියේ ආධිපත්‍ය පූර්ණව ක්‍රියාත්මක කරන ලදී.

E - මව් රාජ්‍යයේ ආධිපත්‍යයට යටත් විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

10. රාජ්‍ය හා පුරවැසියා සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A - පුරවැසියන් පොදු තීරණ ගැනීමට නියෝජිතයන් මඟින් සම්බන්ධ වන වගකිව යුතු නිලධාරින් වේ.

B - රාජ්‍ය විසින් පුරවැසියන්ට දේශපාලන අයිතිවාසිකම් ලබා දෙයි.

C - පුරවැසියන් ද රාජ්‍යයට දේශපාලන වගකීම් ඉටු කිරීමට බැඳී සිටියි.

D - රාජ්‍යයට කිසිවිටක පුරවැසිභාවය අහිමි කළ නොහැක.

E - රාජ්‍ය විසින් පුරවැසියාට ආරක්ෂාව හා සමාජ ආරක්ෂාව සපයයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

11. මාක්ස්වාදය සම්බන්ධයෙන් අදාළ වන්නේ,

A - ආර්ථික සාධකය මුල් කර ගනිමින් ඉදිරිපත් වූ දර්ශනයකි.

B - එය පන්ති සටන්වල ඉතිහාසයකි.

C - එහි පදනම රාජ්‍ය පන්තියක ආයුධයක් ලෙස ක්‍රියාත්මක වන බවයි.

D - අවසානයේ රාජ්‍ය වර්ධනය වන බව පවසයි.

E - සමාජවාදී යුගය කම්කරු පන්තියෙන් බිහිවන බව ප්‍රකාශ කරයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

12. දේශපාලන සමාජානුයෝජනයේ කාරක වශයෙන් හඳුන්වන්නේ,

A - ප්‍රධාන වශයෙන්ම පවුල වේ.

B - දේශපාලන පක්ෂ හා ආණ්ඩුව වේ.

C - ප්‍රබන්ධිත විශේෂ කෙටි කතාය.

D - ආගමික ආයතන හා ආගමික සංවිධානයි.

E - විවිධ සන්නිවේදන මාධ්‍යයයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

13. රාජ්‍ය ප්‍රතිපත්ති

A - විශේෂිත ඉලක්ක සපුරා ගැනීම සඳහා සකස් වේ.

B - ආණ්ඩුව විසින් සැලසුම් කිරීමට යොමු වේ.

C - පුද්ගලික ආයතන විසින් ක්‍රියාවට නංවන්නක් වෙයි.

D - ජනතා ප්‍රශ්න විසඳීම ඉලක්ක කරගනී.

E - ජනතා ප්‍රශ්නවලට ප්‍රතිචාර දැක්වීමට යොදා ගනී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

14. රාජ්‍ය පරිපාලනය,

A - ආණ්ඩුවේ ව්‍යාපාරික අංශයයි.

B - ආණ්ඩුවේ ක්‍රියාකාරී අංශයයි.

C - ආණ්ඩුවේ අරමුණු ඉටු කර ගැනීම සඳහා යොදා ගනියි.

D - මෙහෙය වන්නේ පෞද්ගලික අංශයයි.

E - ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වයට අත්‍යවශ්‍ය වෙයි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

15. අර්ධ සන්ධීය ආණ්ඩු ක්‍රමයකට අදාළ වන්නේ,

A - ලබා දිය හැකි එකම උදාහරණය ඉන්දියාවයි.

B - ඒකීය හා සංධීය යන ලක්ෂණ දෙකම ඇතුළත් වේ.

C - මධ්‍යම ආණ්ඩුව ප්‍රබල වේ.

D - මධ්‍යම ආණ්ඩුවේ විධායක බලතල පාලනය කිරීමට ප්‍රාන්ත ආණ්ඩුවලට නොහැකිය.

E - ද්විත්ව ව්‍යවස්දායකයක් එහි දක්නට නොලැබේ.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

● **පහත සඳහන් තොරතුරු අදාළ කර ගනිමින් අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A - විවිධත්වය තුළින් ඒකීයත්වය කරා පැමිණීම.

B - මට්ටම් දෙකක ආණ්ඩු පැවතීම.

C - එක් කේන්ද්‍රයක සියලු බලතල ඒකරාශී වී තිබීම.

D - බහුවිධ සමාජවලට වඩා සුදුසු වීම.

E - පුරවැසියන් ආණ්ඩු දෙකකට යටත් වීම.

F - ස්වාධිපති බලය බෙදී නොතිබීම.

G - තනි පරිපාලන සහ අධිකරණ ක්‍රමයක් පැවතීම.

H - බලය කාර්යක්ෂම ලෙස ක්‍රියාවට නැංවිය හැකිවීම.

16. සන්ධීය ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ABDE (2) ACDE (3) BDFG (4) CFGE (5) EFGH (......................)

17. ඒකීය ක්‍රමයට අදාළ ප්‍රකාශ කාණ්ඩය තෝරන්න.

(1) ABCD (2) ACDE (3) CFGH (4) ADCF (5) CFGE (......................)

18. සම්භාව්‍ය ලිබරල්වාදය විස්තර කිරීම සඳහා යෝග්‍ය වන ප්‍රකාශය,

A - ආර්ථිකයට මැදිහත් නොවන රාජ්‍යයක් නිර්මාණය කිරීම.

B - රාජ්‍යයේ කාර්යභාරය අසීමිත වේ.

C - කාර්මික ධනවාදයේ පැවැත්ම සහතික කරනු ලැබීය.

D - සමාජ විකාශනයේ ප්‍රතිඵලයක් වශයෙන් රාජ්‍යය නිර්මාණය වීම.

E - රාජ්‍ය නිර්බාදවාදී වේ.

(1) ABCD (2) ABCE (3) BCDE (4) ACDE (5) ABDE (......................)

19. දේශපාලන පක්ෂ,

A - ප්‍රභූ දේශපාලන පක්ෂ, මහජන දේශපාලන පක්ෂ සහ සම්මිශ්‍රිත දේශපාලන පක්ෂ වශයෙන් වර්ග කිරීම.

B - බල අරගලයේ ප්‍රධාන රඟුම්කරුවන් වේ.

C - සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.

D - දේශපාලන පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක වන සෑම රාජ්‍යයකම ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වේ.

E - දේශපාලන සාමාජානුයෝජන ක්‍රියාදාමයේ වැදගත් නියෝජිතයින් වේ.

(1) ABCD (2) ABCE (3) BCDE (4) ACDE (5) ABDE (......................)

20. බලපෑම් කණ්ඩායම්,

A - ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්මට අහිතකර වූවකි.

B - විශේෂිත කරුණක් සඳහා සැලකිලිමත් වන්නකි.

C - ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට හෝ ක්‍රියාවලට බලපෑම් කරන්නකි.

D - ආශා කණ්ඩායම් ලෙස ද හඳුන්වන්නකි.

E - තම ආශාව ඉටු කර ගත් පසු අක්‍රීය වීමට ද ඉඩ ඇත්තකි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

21. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය තුළ,

A - දේශීය ව්‍යාපාරික පංතියක් බිහි විය.

B - වාණිජ වතු වගාව හඳුන්වා දෙන ලදී.

C - නිදහස් ශ්‍රම වෙළඳපළක ක්‍රියාකාරිත්වයක් දැකිය හැකිය.

D - ස්වාධීන පරිපාලන ක්‍රමයක් ක්‍රියාත්මක විය.

E - පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීමක් දැකිය හැකි විය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

22. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ දී,

A - රාජකාරි ක්‍රමය අහෝසි කරන ලදී.

B - දේශීය ආර්ථිකය නඟා සිටුවන ලදී.

C - ආර්ථිකය ජාත්‍යන්තර වෙළඳපොළට බද්ධ කරන ලදී.

D - බටහිරට සමීප වූ සමාජ ක්‍රමයක් ගොඩනංවන ලදී.

E - වෘත්තීය නිලබල පැලැන්තියක් නිර්මාණය කරන ලදී.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

23. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය,

A - ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය දුර්වල කළේ ය.

B - සීමිත වගකීම් සහිත ආණ්ඩුවක් ලබා දීමට කටයුතු කළේය.

C - නියෝජිත ක්‍රමය මත පදනම් වූයේ ය.

D - අනාගත දේශපාලනඥයින් පුහුණු කිරීමට දායක වූයේ ය.

E - කොන්දේසිවලට යටත්ව අවුරුදු 21ට වැඩි සියලු දෙනාට ම ඡන්ද බලය ප්‍රදානය කළේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

24. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A - ව්‍යවස්ථාදායක විධායක කටයුතු සීමිත වශයෙන් රාජ්‍ය මන්ත්‍රණ සභාවට පවරා දුන්නේය.

B - ආණ්ඩුකාරවරාගේ තත්ත්වය නාමික මට්ටමට පහත හෙළීම.

C - රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු හඳුන්වා දුන්නේ ය.

D - අමාත්‍ය මණ්ඩලයක ක්‍රියාකාරිත්වයක් ස්ථාපිත කළේ ය.

E - විධායක කාරක සභා හතක් පිහිටුවා වැඩකටයුතු බෙදා දුන්නේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

25. 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව,

A - වෙස්මිනිස්ටර් ආකෘතියක ක්‍රියාකාරිත්වයක් හඳුන්වා දුන්නේ ය.

B - නාමික විධායක අග්‍රාණ්ඩුකාරධූරයක් ස්ථාපිත කළේ ය.

C - ද්විමාණ්ඩලික පාර්ලිමේන්තුවක් නිර්මාණය කළේ ය.

D - අධිකරණ කටයුතු සම්බන්ධ ඉහළම අධිකරණ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට මුදා හළේ ය.

E - අධිකරණ ඇමති සෙනෙට් මණ්ඩලයෙන් තෝරා පත් කර ගත්තේය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

26. 1948 සෝල්බරි ව්‍යවස්ථාදායකය,

A - පාර්ලිමේන්තු ස්වාධිපත්‍යය අවධාරණය කළේ ය.

B - 29 - 2 වගන්තියට යටත්ව නීති පැනවීමේ බලය භුක්ති වින්දේය.

C - කථානායකවරයෙකුගේ නායකත්වය මත ක්‍රියාත්මක වූයේ ය.

D - ක්‍රියාකාරී විධායකය තෝරා පත් කර ගැනීමට දායක වූයේ ය.

E - 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිහිටුවා ගැනීමත් සමඟ අහෝසි වූයේ ය.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

27. සෝල්බරි ව්‍යවස්ථාව යටතේ සෙනෙට් මණ්ඩලය,

A - සාමාජිකයින් 30කින් සමන්විත වේ.

B - අඛණ්ඩව ක්‍රියාත්මක වූ ආයතනයක් වේ.

C - මුදල් නොවන පනත් කෙටුම්පතක් අරභයා මුල් පිරීමේ හැකියාව පැවතුණි.

D - සෙනෙට් සභිකයෙකු වීම සඳහා අවම වයස අවුරුදු 35ක් සම්පූර්ණ කර තිබිය යුතුය.

E - සාමාජිකයින් පත් කරනු ලබන්නේ අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.

(1) ABCD (2) BCDE (3) ABDE (4) ACDE (5) ABCE (......................)

- **අංක 28 සිට 30 දක්වා වූ ප්‍රශ්න සඳහා සපයා තිබෙන ප්‍රකාශ පහෙන් එකක් පමණක් නිවැරදි වේ. නිවැරදි ප්‍රකාශය තෝරන්න.**

28. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන්ගේ වැටුප් තීරණය කරනු ලබන්නේ,

(1) අධිකරණ සේවා කොමිසම විසිනි. (2) පාර්ලිමේන්තුව විසිනි.

(3) පාර්ලිමේන්තු සභාව විසිනි. (4) රාජ්‍ය සේවා කොමිසම විසිනි.

(5) අමාත්‍ය මණ්ඩලය විසිනි. (......................)

29. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තෝරාගනු ලබන්නේ,

(1) මැතිවරණ කොමසාරිස්වරයා ය. (2) පාර්ලිමේන්තුව ය.

(3) මැතිවරණ කොමිෂන් සභාව ය. (4) ජනතාව ය.

(5) පාර්ලිමේන්තු සභාව ය. (......................)

30. ස්වස්ථානික ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් වන්නේ,

(1) සෝල්බරි ව්‍යවස්ථාව (2) ඩොනමෝර් ව්‍යවස්ථාව

(3) පළමු ජනරජ ව්‍යවස්ථාව (4) මැකලම් ව්‍යවස්ථාව

(5) කෝල්බෘක් ව්‍යවස්ථාව (......................)

## B කොටස

- **කෙටි පිළිතුරු සපයන්න.**

31. දේශපාලන ආයතන දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

32. දේශපාලන භාවිතයන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

33. තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශයේ ධාරා තුනකි. ඉන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

34. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශයේ ප්‍රධාන චින්තකයින් දෙදෙනෙකු සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

35. දේශපාලන පක්ෂවල කාර්යයන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

36. දේශපාලන හා සමාජ න්‍යායේ සිවිල් සමාජය යන්නට ඇති සංකල්පීය ඉතිහාසය තුළ එය අර්ථ හතරකින් භාවිත කරනු දැකිය හැකිය. ඉන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

37. (1) තුලනාත්මක දේශපාලනයේ නිර්මාතෘවරයා කවුරුන් ද?
    (1) ..............................
    (2) දේශපාලනය අධ්‍යයනය සඳහා තුලනාත්මක ප්‍රවේශයන් භාවිත කළ චින්තකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

38. ආණ්ඩුවේ ප්‍රධාන ස්ථර තුනකි. ඉන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

39. රාජ්‍ය මාදිලි සහ වර්ගීකරණ දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

40. ලිබරල්වාදය ප්‍රභේද තුනක් ඔස්සේ හඳුනාගත හැකි ය. ඉන් දෙකක් සඳහන් කරන්න.
    (1) ..............................
    (2) ..............................

41. විධායක බලය හසුරුවන ආකාරය අනුව ආණ්ඩු වර්ග වේ. ඒවායින් දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

42. සමාජ සම්මුතිවාදීන් විසින් පෙන්වා දෙනු ලැබූ සමාජ ක්‍රම දෙක සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

43. පැසිස්ට්වාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

44. ගැටුම්වල නිශේධනීය පැතිකඩ දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

45. ගැටුම් තුන් ආකාරයකට වර්ග කළ හැකිය. දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

46. ගැටුම් ජීවන චක්‍රයේ අවස්ථා දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

47. ප්‍රතිසන්ධානගත වීම මට්ටම් තුනකින් සිදුවීම අවශ්‍ය වේ. ඉන් දෙකක් සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

48. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය අධිපති ද්වි පක්ෂ ක්‍රමයක් ලෙස හඳුන්වනු ලැබේ. එම අධිපති පක්ෂ දෙක නම් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

49. නූතනයේ ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් බහුල ලෙස යොදා ගන්නා නියෝජන ක්‍රම දෙක කුමක් ද?
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

50. සාර්ක් සංවිධානයේ තීරණ ගනු ලබන ඉහළම ආයතන දෙක සඳහන් කරන්න.
(1) ..............................................................................................................................................
(2) ..............................................................................................................................................

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# தென் மாகாணக் கல்வித் திணைக்களம்
# Southern Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

**දේශපාලන විද්‍යාව - I**

**Political Science - I**

**23 S II**

පැය 03යි

**Three hours**

විභාග අංකය : ....................................................................

***සැලකිය යුතුයි.***

- **මෙම ප්‍රශ්න පත්‍රය I, II සහ III වශයෙන් කොටස් තුනකින් යුක්ත වේ. මෙම කොටස්වලින් ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද, දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක් ද, තුන්වෙනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **II පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.**

## I කොටස

(01) දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර පවතින සම්බන්ධතාවය කෙබඳුදැයි සාකච්ඡා කරන්න.

(02) දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා යොදා ගනු ලබන ඕනෑම අධ්‍යයන ක්‍රම දෙකක් විස්තර කරන්න.

(03) පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
- (1) රාජ්‍යයක් සංයුක්ත වන සාධක
- (2) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක මූලික ලක්ෂණ
- (3) පැසිස්ට්වාදී රාජ්‍යය
- (4) ජනාධිපති ආණ්ඩුක්‍රමය

## II කොටස

(04) රාජ්‍ය පිළිබඳ ව ඉදිරිපත්ව තිබෙන සමාජ සම්මුතිවාදය පිළිබඳව විමසන්න.

(05) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව විභාග කරන්න.
- (1) දේශපාලන පක්ෂ ක්‍රමය
- (2) බලපෑම් කණ්ඩායම්
- (3) සිවිල් සමාජය
- (4) ස්ත්‍රී වාදය
- (5) රාජ්‍යය හා ආණ්ඩුව

(06) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල සමාජ, ආර්ථික, දේශපාලන ප්‍රතිඵලවල බලපෑම සාකච්ඡා කරන්න.

(07) 1931 දී හඳුන්වා දෙනු ලැබූ ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ දක්නට ලැබුණු මූලික අංග ලක්ෂණ මොනවාදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

## III කොටස

(08) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව විමර්ශනය කරන්න.

(1) සාර්ථක සන්ධීය ආණ්ඩුක්‍රමයක් බිහි වීමට බලපෑම් කරන සාධක
(2) ඒකීය ආණ්ඩුක්‍රමයක වාසි, අවාසි
(3) නිරාගමික වාදය
(4) සමූහාණ්ඩුවාදය
(5) ග්‍රීක නාගරික රාජ්‍ය ක්‍රමය

(09) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව විමසන්න.

(1) ගැටුම් සමථන මාධ්‍ය
(2) සාමය ගොඩ නැඟීම.
(3) ගැටුම් සමථන ක්‍රියාවලිය

(10) පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව විභාග කරන්න.

(1) දේශපාලන ආයතන
(2) දේශපාලන භාවිතයන්
(3) දේශපාලන මතවාද
(4) දේශපාලන චර්යාව
(5) ආණ්ඩුකරණය

Answer

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
**Southern Provincial Department of Education**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ), 12 ශ්‍රේණිය, අවසාන වාර පරීක්ෂණය, 2019 ජූලි

**General Certificate of Education (Adv. Level), Grade 12, Year End Test, July 2019**

# දේශපාලන විද්‍යාව - පිළිතුරු පත්‍රය

## I පත්‍රය

## I කොටස

| | | | | |
|---|---|---|---|---|
| 01. (1) | 08. (3) | 15. (1) | 22. (4) | 29. (4) |
| 02. (5) | 09. (5) | 16. (1) | 23. (2) | 30 (3) |
| 03. (3) | 10. (5) | 17. (3) | 24. (4) | |
| 04. (3) | 11. (5) | 18. (4) | 25. (5) | |
| 05. (5) | 12. (3) | 19. (2) | 26. (2) | |
| 06. (5) | 13. (3) | 20. (2) | 27. (5) | |
| 07. (4) | 14. (5) | 21. (1) | 28. (2) | |

(ලකුණු 1 × 30 = 30)

## II කොටස

31. (1) පාර්ලිමේන්තුව/ අධිකරණය
    (2) ආණ්ඩුව/ කැබිනට් මණ්ඩලය

32. (1) නිදහස/ සමානාත්මතාව/ මැතිවරණ ක්‍රියාවලිය
    (2) ප්‍රජාතන්ත්‍රවාදය/ නිදහස් හා සාධාරණ මැතිවරණ

33. (1) සම්භාව්‍ය තුලනාත්මක අධ්‍යයන ප්‍රවේශය
    (2) විසිවන සියවසේ තුලනාත්මක දේශපාලන අධ්‍යයන සමකාලීන තුලනාත්මක දේශපාලන අධ්‍යයනය

34. (1) කාල්මාක්ස්/ ඇඩම්ස්මිත්
    (2) ජෝන් ස්ටුවට් මිල්/ ජෙරමි බෙන්තම්/ තෝමස් මැල්තස්

35. (1) විසිරී ඇති මහජනමතය ඒකරාශී කිරීම.
    සමාජ බලය අධිකාරී බලය බවට පත් කිරීම.
    (2) නායකයින් පුහුණු කිරීම.
    ජනතාව දේශපාලන වශයෙන් දැනුවත් කිරීම.

36. (1) සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය/ නව මාක්ස්වාදී ග්‍රාම්දියානු අර්ථය
    (2) සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය/ සාංගමික ප්‍රජාතන්ත්‍රවාදී අර්ථය

37. (1) ඇරිස්ටෝටල්
    (2) ඇරිස්ටෝටල්/ නිකලෝ මැකියාවලී

38 (1) විධායකය/ ව්‍යවස්ථාදායකය
   (2) අධිකරණය

39. (1) ග්‍රීක නාගරික රාජ්‍ය/ සමාජවාදී රාජ්‍ය
    (2) ලිබරල්වාදී රාජ්‍ය/ පැසිස්ට්වාදී රාජ්‍ය/ රාජාණ්ඩු ක්‍රමය

40. (1) සම්භාව්‍ය ලිබරල්වාදය (2) නූතන ලිබරල්වාදය

41. (1) ජනාධිපති ආණ්ඩුක්‍රමය / පාර්ලිමේන්තු හෙවත් කැබිනට් ආණ්ඩුක්‍රමය
    (2) මිශ්‍ර හෙවත් අර්ධ ජනාධිපති ආණ්ඩුක්‍රමය

42. (1) ප්‍රකෘති සමාජය, ස්වභාවික සමාජය
    (2) සිවිල් සමාජය

43. (1) රණපරමවාදය/ බලකාමය
    (2) බුද්ධි විරෝධීතාවය/ ජාතිවාදී හැඟීම් ඇවිස්සීම.

44. (1) ජීවිත හානි/ දේපල හානි (2) පරිසර හානි

45. (1) සරල වර්ගීකරණය/ කෘත්‍යවාදී වර්ගීකරණය
    (2) දේශපාලන වර්ගීකරණය

46. (1) ගැටුම් පැනනැගීම. (2) ගැටුම් උත්සන්න වීම.

47. (1) මනෝ විද්‍යාත්මක ක්‍රියාමාර්ග
    (2) සමාජීය ක්‍රියාමාර්ග/ දේශපාලන ක්‍රියාමාර්ග

48. (1) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (2) එක්සත් ජාතික පක්ෂය

49. (1) සරල බහුතර නියෝජන ක්‍රමය
    (2) සමානුපාතික නියෝජන ක්‍රමය

50. (1) සාර්ක් රාජ්‍ය නායක සමුළුව
    (2) විදේශ අමාත්‍යවරුන්ගේ සාර්ක් රාජ්‍ය නායක සමුළුව

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර






- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

**071 777 4440**